අභ්‍යන්තර චක්‍රලේඛ අංක :- 04/2022

මගේ අංකය :- BD/PGH/CPHMA/1/2013

~~අධ්‍යක්ෂ~~

පළාත් මහා රෝහල

බදුල්ල

**2022/08/08**

සියලුම රෝහල් කාර්යමණ්ඩලය වෙත,

<u>බාහිර රෝගී ඒකකයේ සහ හදිසි ප්‍රතිකාර ඒකකයේ සිදුවන මරණ ලේඛන ගතකිරීමේ නව ක්‍රමවේදය සම්බන්ධව</u>

**2022.08.04** දින නියෝජ්‍ය අධ්‍යක්ෂක ,අධිකරණ විශේෂඥ වෛද්‍ය නිලධාරී ,බාහිර රෝගී ඒකකයේ වෛද්‍ය නිලධාරී,හදිසි ප්‍රතිකාර ඒකකයේ වෛද්‍ය නිලධාරී,ලියාපදිංචි වෛද්‍ය නිලධාරී, ප්‍රධාන විශේෂශ්‍රේණි හෙද නිලධාරී, බාහිර රෝගී ඒකකයේ අංශ ප්‍රධානි හෙදනිලධාරී සමග පැවති රැස්වීමේදී බාහිර රෝගී ඒකකයේ සහ හදිසි ප්‍රතිකාර ඒකකයේ සිදුවන මරණ විධිමත්ව ලේඛන ගතකිරීම සඳහා ක්‍රමවේදයක් සකස්කර ගැනීම පිළිබඳ පවතින ගැටළු සාකච්ඡා කර එහිදී ගන්නා ලද තීරණ වලට අනුව, වඩා නිවැරදි ලේඛන ගත කිරීමක් සඳහා පහත පරිදි සංශෝධන ඉදිරිපත් කරනු ලැබේ.මෙම නව ක්‍රමවේදය **2022.08.09** දින සිට ක්‍රියාත්මක කලයුතු බව දන්වා සිටිමි.

ඒ අනුව,වගවීම හා වගකීම තහවුරු කෙරෙන විධිමත් ක්‍රමවේදයක් සකස්කිරීම අරමුණින් මරණ විධිමත්ව ලේඛන ගතකිරීමේදී පහත නව පියවරයන් අනුගමනය කල යුතුය.

- හදිසි ප්‍රතිකාර ඒකකයේ සිදුවන මරණ සහ වාට්ටුවල දී සිදුවන මරණ රෝහලෙන් පිටවීමට ප්‍රථම අනිවාර්යෙන්ම මෘත ශරීරාගාරය වෙත යොමු කලයුතු අතර එකී සෑම මරණයක්ම අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාලයේ (පැය 24 පුරා)ලේඛන ගත කළ යුතු බව.
- සෑම මරණයක් සඳහාම ඇද ඉහපත් අංකයක් තිබිය යුතුය.හදිසි ප්‍රතිකාර ඒකකයේ මරණයක් වුවහොත් වාට්ටුව ඉවත් කර හදිසි ප්‍රතිකාර ඒකකයේ මරණයක් ලෙසඇද ඉහපත් අංකය ලියාපදිංචි විය යුතුය.
- බාහිර රෝගී ඇතුළත් කිරීමේ ඒකකය සහ හදිසිප්‍රතිකාර ඒකකයේදි සිදුවන මරණ, පශ්චාත් මරණ පරීක්ෂණයට යොමු නොවී හදිසි මරණ පරීක්ෂණයකින් පමණක් නිදහස් කරන්නේ නම් අනිවාර්යෙන් අධිකරණ වෛද්‍ය විශේෂඥ වෛද්‍ය නිලධාරිගෙන් හෝඅධිකරණ වෛද්‍ය නිලධාරිගේ මතය විමසා සටහන්කර මරණය හේතුව ලබා ගෙන නිදහස් කිරිමට කටයුතු කළයුතුය.
- සෑම මරණයක් සිදු වී පැය 2 ක් සම්පූර්ණ වූ විගස මෘතශරීරාගාරය දැනුවත් කල යුතුය.
- ඇද ඉහපත් වල සටහන් යෙදීමේදී පහත කරුණු ගැන සැලකිලිමත් විය යුතුය.
  1. සටහන් රෝගී ප්‍රතිකාර වලට අදාල ඒවා පමණක් වීමට වග බලාගැනීම
  2. ප්‍රතිකාර සඳහා ලබාදී ඇති උපදෙස් නැවත වරක් නොලියා ඒ වෙනුවට එය පිළිපැදි බවට (√)සලකුණු කර අත්සන හා වේලාව සටහන් කිරීම
  3. ප්‍රතිකාර කර අවසන් වී නැවත ආපසු සටහන් කිරීමේදී ද මේ ක්‍රමවේදය අනුගමනය කිරීම.

     *(නැවත විස්තරාත්මක සටහනක් හෙද කාර්ය මණ්ඩලය යෙදීම අවශ්‍ය නොවේ.)*

(127)

4. හදිසි ප්‍රතිකාර ඒකකයේ අවසානයේ එකතුවන ඇඳ ඉහපත් අදාල කටයුතු අවසන් කර ලේඛනාගාරය වෙත ලබා දීමටඒකකභාර හෙද නිලධාරී විසින් කටයුතු සිදුකල යුතුය.

ඉහත නිර්දේශයන් අදාල කමිටුව මගින්යෝජනා වී ස්ථාපනය කිරීමට සුදුසු බව මා වෙත දන්වා සිටින ලදී.

ඉහත ක්‍රමවේදයන් මගින් මරණ ලේඛන ගත කිරීමක් විධිමත්ව සිදු කිරීමට හා ගැටළු අවම කර ගැනීමට බලාපොරොත්තු වන අතර ඒ සඳහා සියලුම ඒකකභාර නිලධාරීන්ගේ සහයෝගය ලබා දීමට කටයුතු කරන්න .

........................

අධ්‍යක්ෂක

පළාත් මහා රෝහල - බදුල්ල

Dr. Upul Karunarathne
MBBS.MSc (Med.Admin). MD(Med.Admin)
Director
Provincial General Hospital
Badulla.

පිටපත් - : 1 . අධිකරණවෛද්‍ය විශේෂඥ වෛද්‍ය නිලධාරී
2 .MOIC (බාහිර රෝගී අංශය)
3.සියලු ඒකකභාර නිලධාරීන්
4.බාහිර රෝගී අංශය (රෝගීන් ලියාපදිංචි කිරීම)
5.හදිසි ප්‍රතිකාර ඒකකය
6.හදිසි මරණ පරීක්ෂක
7.රෝහල් ඔීවිසියර්